# ජනාධිපති

ආපසු හැරෙන්න
බැරි රටේ
ආපසු
හැරෙන්නේ
නැති
පොදු ජන
නායකත්වයේ
දෙවර්ෂ පූර්ණ
පදවි සම්ප්‍රාප්තිය





**‘ඔව්, මම වෙනත් දේශපාලකයන් වගේ නෙවෙයි. මා ළඟ තියෙන්නේ දීර්ඝ කාලීන සැලසුම්. මම සැලසුම් හදන්නේ මගේ අභිවෘද්ධියට නෙවෙයි. තරුණ පරම්පරාව වෙනුවෙන් මම අද දවසේ පැල කරන ගසෙහි එලදාව මට බුක්ති විදින්න නොලැබෙන බව හොඳින්ම දන්නවා. ඒත් හෙට දවසේ අපේ දරුවන්, අපේ අනාගත පරම්පරාව ඒ එලදාව බුක්ති විදීවි.”**

ශ්‍රී ලංකා මාතාව දීර්ග කාලයක් මුළුල්ලේ විලිරුදා වින්දේ ලෝකය දිග්විජය කරන්නට අවැසි යුග පුරුෂයකු බිහිවන තුරුය. අනේක විද පීඩාවන්ට ගොදුරු වෙමින් ඉතිහාසයේ දුෂ්කරම කාල පරිච්ඡේදයක ඇගේ අපේක්ෂාවන් සඵල කරමින් ඒ සුබ මොහොත උදාවිය. ගෞතම බුදුන් වහන්සේ පස්මහ බැලුම් ප්‍රකාරව ලොවට බිහිවුණා සේ රටට අවශ්‍යම කාලයේ, අවශ්‍යම විසඳුම සහිත, අවශ්‍යම නායකත්වය රටට ලැබිණි. 2022 වසරේ ජුලි 21 වනදා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිනව ජනාධිපතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහතා තෝරා පත් කර ගන්නා ලදී.

ඒ වෙනුවෙන් දායක වූ පාර්ලිමේන්තු මහජන නියෝජිතයන් 134 දෙනා ගත් තීන්දුව මෙරට පාර්ලිමේන්තු ඉතිහාසය තුළ සදා අනුස්මරණය වනු ද ඇත. මන්ද මෙරට දැවැන්ත යුග පෙරළියකට ඔවුන්ද දායක වූ බැවිනි. රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තුව තුළ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ එකම මන්ත්‍රීවරයා ලෙස සිටියත් මෙරට ඉතිහාසය තුළ රට මුහුණ දුන් බරපතලම අර්බුදකාරී මොහොතේ, රාජ්‍ය පාලනය පාලකයන් වෙතින් ගිලිහී රට අරාජකත්වයට පත් වෙමින් පුරවැසි ජනතාව කෙළවරක් නැති දුෂ්කරතාවලින් බැට කමින් පීඩාවට පත්ව අපේක්ෂා භංගත්වයට පත්ව සිටි මොහොතක, යළි රට දේශපාලනිකවත් ආර්ථිකමය ලෙසත් ස්ථාවර කිරීමේ අභියෝගය භාරගැනීමට කිසිවකුත් ඉදිරිපත් නොවුණු මොහොතක රටේ වගකීම භාරගැනීම සිදු කළේය. එදා පුරවැසි ජනතාව ඉල්ලා සිටියේ කුසට අහරක් පමණක් නොවේ, තෙල් ගෑස් විදුලිය පමණක් නොවේ. නව දේශපාලන ආර්ථික ක්‍රමයක අවශ්‍යතාවය අරගලයක් බවට පත්ව තිබිණි. සිස්ටම් චේන්ජ් එකක් රටට අවශ්‍ය බව පැවැසුනි. අලුත් පදනමක් මත රට ගොඩනැගීම විය යුතුබව පැවැසුනි. ඒ වෙනස වෙනුවෙන් සූදානම් වීම හැර වෙනත් විකල්පයක් රට සතුව තිබුණේ නැත.

**එහෙත් ඒ අවශ්‍යතාවය පූර්ණ කිරීමට සමත් දේශපාලන නායකත්වයක් රට හමුවේ පෙන්වීමට හැකියාව ඉතිරිව තිබුණේ රනිල් වික්‍රමසිංහ මහතා සතුව පමණි. රටේ වගකීම භාරගන්නැයි ආරාධන ලද සජිත් ප්‍රේමදාස, අනුර කුමාර ඊට මුහුණ නොදී පැන ගියේය. ඔවුන් සතුව උත්තර තිබුණේ නැත.**

2022 ජුලි 13 වනදා වැඩ බලන ජනාධිපතිවරයා ලෙස ඒ වන විට අගමැතිවරයාව සිටි රනිල් වික්‍රමසිංහ මහතා දිවුරුම් දුන් අතර ව්‍යාකූල වූ සමාජය යළි ව්‍යවස්ථානුකූල කරමින්, අලුත් ගමනක් සඳහා අවශ්‍ය බලාපොරොත්තු සහගත බව පුරවැසි ජනතාවට ලබා දෙන ලදී. ඒ අනුව රටට අවශ්‍යම නායකත්වය රනිල් වික්‍රමසිංහ බව තහවුරු කරමින්, ජුලි 21 වන දා මෙරට ඉතිහාසයේ වඩාත්ම තීරණාත්මක දිනය බවට පත් කරමින් විධායක ජනාධිපතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහතාව නිල වශයෙන් තෝරා පත් කරගැනීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සිදු විය.

එදිනෙන් ඇරඹුන දුෂ්කර නමුත් නිවැරදිම ගමන් මගෙහි දෙවසරක කාලයක් දැන් අවසන්ව තිබේ. රට ඉල්ලා සිටි අලුත් ගොඩනැංවීමක් සඳහා වන අවශ්‍ය ශක්තිමත් පදනම දැමීමටත් අනාගතය වෙනුවෙන් සංවර්ධනාත්මක පියවර ගැනීමටත් මේ කාලය තුළ ජනාධිපති රනිල්ට හැකි විය. රනිල් වික්‍රමසිංහ මහතා, බංකොලොත් තත්වයට ඇද වැටුණ රට යළි ගොඩනැගිම බාරගත්තේ එහි ඇති භාරදූර කාර්යභාරය ගැන ඉතා දැනුවත්වය. එය වැරදුනොත් තමන්ගේ දේශපාලන ජීවිතය එයින් කෙළවර වන්නට ඉඩ තිබුණු බව දැන ගෙනය. තමන් දශක පහක් තිස්සේ ගොඩනගා ගත් අභිමානය කෙලෙසෙන්ට ඉඩ තිබුණු බව දැන ගෙනය. තම පක්ෂය වු එජාපය බිංදුවටම වැටී තිබුණු මොහොතක යළි එය මුළුමනින්ම අතුගෑවී යන්නට ඉඩ තිබෙන බව දැන ගෙනය. ඒ සියලු අවිනිශ්චිතා සමඟ රනිල් නැගීසිටියේ ඒ සියල්ලට වඩා අලුත් දෙයක් රට වෙනුවෙන් විය යුතුය කියන අධිෂ්ඨානයෙනි.

**"හරි දේ කරලා පැරදුනත් කමක් නැහැ"** කියන තිර ප්‍රතිපත්තිමය තීරණයක සිට ඔහු වැඩ පටන් ගත්තේය. රනිල් වික්‍රමසිංහ සතුව තිබුණු ශක්තිය වූයේ ඔහු පිළිගත්, ගරු කළ සහ ක්‍රියාත්මක කිරීම සඳහා අප්‍රතිහත ධෛර්යයකින් කාලාන්තරයක් තිස්සෙ ඉවසීමෙන් බලාගෙන සිටි ප්‍රතිපත්ති සමූහයක් පමණි. ඒ සමඟ ඔහුට ඉඩ ලැබුණු සෑම විටම ඔහු කටයුතු කළේ රට සංවර්ධිත රාජ්‍යයක් දක්වා ගොඩනැංවීමේ අධිෂ්ඨානය සහිතවය. ඔහු ජනාධිපතිධුරය භාරගෙන දෙවසරකට පසුව එහි මහඟු ප්‍රතිඵල රටත් ජනතාවත් භුක්ති විඳිමින් සිටී. අනාගතය ගැන තවත් සුවහසක් බලාපොරොත්තු පොදි ගහගෙන මෙරට පුරවැසි ජනතාව, ජනාධිපති රනිල් සමඟ පෙරට යන මේ මොහොතේ පසුගිය දෙවසර ගැන කරන සාරංශගතකරණයකි මේ.






ශ්‍රී ලංකාව බංකොලොත් වන්නේම නිදහසෙන් පසුව අඛණ්ඩ, නිවැරදි ප්‍රතිපත්තියක්, සැලසුමක්, වැඩපිළිවෙලක් නොමැතිව අනුගමනය කළ වැරදි ක්‍රම පද්ධතියක්, නැතිනම් සිස්ටම් එකක් නඩත්තු කරගෙන යෑම දැන හෝ නොදැන සිදුවීමේ දේශපාලනික අත්වැරැද්ද නිසාය.

රට යළි ගොඩනැගුමට නම්, වැරදි පිළිවෙත් මුළුමනිම වෙනස් කළ යුතු විය. විටින් විට දමන පැලැස්තර විසඳුම්, ජනප්‍රිය විසඳුම්, කෙටිකාලීන තාවකාලික විසඳුම්, මැතිවරණ වේදිකා මත කරන කයිවාරු වලට තවදුරටත් රටේ අර්බුද විසඳාගැනීමට කිසිවක් කිරීමේ හැකියාව තිබුණේ නැත. එතැනින් වෙනස්ව ජනාධිපති රනිල් යළි පටන්ගත්තේ සමස්ත ක්‍රම පද්ධතියම වෙනස් කරන පුළුල් හා දුෂ්කර සැලසුමක් අනුවය.









## “හැමදේටම වඩා වටින්නෙ මිනිස් ජීවිතයි!”

ආර්ථික පදනම නැවත ගොඩනැංවීමේදී පුරවැසියා ඊට ශක්තිමත්ව සූදානම් කිරීම විය යුතුය. රනිල් වික්‍රමසිංහ ජනාධිපති පදවියට පත් සැනින් ක්‍රියාත්මක වූයේ ඒ වෙනුවෙනි.

කොවිඩ් 19 වසංගත තත්වයේ සිට දිග ඇදුනු දුෂ්කර ආර්ථික වාතාවරණයන් හමුවේ රැකියා අහිමි වීම්, ආදායම් අහිමිවීම් නිසා පීඩාවට පත් වූවන් සහ සමෘද්ධි ප්‍රතිලාභීන් ඇතුළු අඩු ආදායම් ලාභී පවුල්වලට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතාවයන් වැලැක්වීම වෙනුවෙන් 2023 වර්ෂයේ සැප්තැම්බර දක්වා රුපියල් 5000 බැගින් මාසික මුදල් සහනයක් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවේය. අඩු ආදායම් ලාභී පවුල් ලක්ෂ 29 ක් සඳහා සහල් කිලෝග්‍රෑම් 10 බැගින් ලබාදීමෙ වැඩසටහනක් දියත් කරන ලද අතර අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිළ අඩු කිරීමට පියවරගන්නා ලදී.





වඩා ක්‍රමවත් සමාජ සවිබල ගැන්වීමේ දිගු කාලීන වැඩසටහනක් ලෙස 'අස්වැසුම' සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ නව යෝජනා ක්‍රමය දියත් කළ අතර කිසිවකුත් අත් නොහැරෙන ලෙස දුළිදුභාවයට පත් පවුල් ලක්ෂ 20 ක් පමණ ආර්ථික වශයෙන් නඟා සිටුවීමේ දැවැන්ත වැඩපිළිවෙල දියත් කළේය. මේ අනුව සමෘද්ධි සහනනාධාරය මෙන් තුන් ගුණයකට වැඩි මූල්‍ය ප්‍රතිලාභ ලබා දීම සිදු කළේය. සමාජ ආරක්ෂණය පිරිවැය වෙනුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සම්මත කළේය. අර්බුද සමඟ ඇති වූ බරපතල ගැටළුවක් වූ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම සඳහා බහු-ආංශික යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලැබුවේය. ප්‍රාථමික ශ්‍රේණි පාසල් දරුවන් වෙනුවෙන් නොමිලයේ දිවා ආහාර වැඩ සටහනක් දියත් කළේය. ගැබිණි මාතාවන්ට පෝෂණ මල්ලක් ලබා දීම, වකුගඩු ආදී නිධන්ගත රෝග වලින් පෙලෙන්නට ලබා දෙන සහනාධාරය, ආබාධිත වූ පුරවැසි දීමනා, වැඩිහිටි දීමනා ආදියද වැඩි කිරීම සිදු කළේය. මේ අතර ජනාධිපති රනිල්, සිය රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පාවිච්චිකර මිතුරු රාජ්‍යයන්ගේ සහ ජාත්‍යන්තර සංවිධාන වල මූල්‍ය සහ ද්‍රව්‍යමය සහය ලබාගෙන





පොහොර, ආහාර, ඖෂධ, ඉන්ධන ගෑස් හිඟය ක්‍රමයෙන් අවසන් කර පෝලිම් යුගයට තිත තැබිණි. පැය දහය දොළහා වූ විදුලි කප්පාදුව ද ක්‍රමයෙන් අවසන් කරන ලදී. එලෙස ජන ජීවිතය සාමාන්‍යකරණයට පත් කිරීම කෙටි කාලයක් තුළ සිදු කරන ලදී.

## “කඩා වැටුණු රටවල් අතරින් ඉක්මණින්ම

# ගොඩගත්තෙ අපේ රටයි

පීඩාවට පත් පුරවැසියන්ට කඩිනම් සහන ලබා දීම සඳහා හදිසි ප්‍රතිකර්ම යෝජනා ක්‍රියාත්මක කිරීම සමඟ තවදුරටත් ජනතාව මුහුණ දෙමින් තිබූ පීඩාවන් අවම කිරීම සහ දශක ගනනාවක් තිස්සේ පවත්වාගෙන එමින් තිබූ ආර්ථික ක්‍රමවේදය වෙනස්කිරීම වෙනුවෙන් කඩිනම් ප්‍රතිසංස්කරණ හා දීර්ඝ කාලීන විසඳුම් ඉලක්ක කරගත් නව අයවැය යෝජනාවලියක් 2023 වසර වෙනුවෙන් ගෙන එන ලදී.



## ජාත්‍යන්තර සහයෝගය

ජනපති රනිල් වික්‍රමසිංහගේ අවබෝධය වුයේ සියල්ලට පෙර පාරෙන් ඉවතට ඇද වැටී බරපතල තුවාල ලත් රට යළි නිවැරදි මාර්ගයට ගෙන ඒමට පෙර දෙපයින් නැගී සිටුවීම පළමුව කළ යුතු බවය. කොවිඩ් 19 වසංගතයේ බලපෑමටත්, ආර්ථිකය සම්බන්ධයෙන් පැවති පාලනය ගත් වැරදි තීන්දු තීරණ නිසාත්, ලෝක ආර්ථික අර්බුදයේ බලපෑමටත් හසුවී රටේ තත්වය සීග්‍රයෙන් නරක අතට හැරී තිබුණේ එදා පාලකයන්ට තත්වය කළමණාකරගත නොහැකිවය.

රාජ්‍ය බදු ආදායම් අහිමි කරගැනීම, විදේශ විනිමය අහිමි වීම, ණය ගෙවා ගැනීම හෝ ණය ගැනීමේ හැකියාව නොමැතිව රට බංකොලොත් බව ප්‍රකාශයට පත්කිරීම ආදීය නිසා මුහුණ දෙන්නට වූ අර්බුද විසඳා ගැනීමට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබා ගැනීම හැර වෙනත් විකල්ප ඉතිරිව තිබුණේ නැත. විපක්ෂ කොටස් වල විරෝධයන් මධ්‍යයේ වුවත් රනිල් ජනාධිපති පදවියට පත්ව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබගැනීම වෙනුවෙන් වන සියලු පියවර කඩිනමින් ගනු ලැබුවේ ඒ වන විටත් එම පියවර ගැනීම ප්‍රමාද වී තිබීමත්, රට වඩාත් බරපතල බේදනීය තැනකට ඇද වැටෙමින් තිබු තත්වයන් හමුවේය. මාස කිහිපයක් ඇතුළත මූල්‍ය අරමුදලේ සහය ලබාගැනීමට හැකි වූ අතර ඒ වෙනුවෙන් වන කඩිනම් ආර්ථික ප්‍රතිසංස්කරණ රැසක් ක්‍රියාත්මක කළේය. ඒ අනුව ආර්ථිකය යළි දෙපයින් සිටුවා යායුතු මාර්ගයට ඇදගැනීමට ජනපති රනිල් සමත් විය.

මූල්‍ය අරමුදල වසර හතරක කාලයක් තුළ වාරික 12 කින් ගෙවෙන, ඩොලර් බිලියන 2.9 ක විස්තීරණ ණය පහසුකම් පැකේජය ලබා දීමට එකඟ වූයේ ආර්ථිකය ප්‍රතිසංස්කරණ සඳහා මෙරට රජය දක්වන කැපවීම මතය. ඒ අනුව මූල්‍ය අරමුදලේ නිර්දේශ මත ප්‍රතිසංස්කරණ ගනනාවක් ක්‍රියාත්මක කිරීමට සිදුවිය.

ඒවා මූලික වශයෙන්, රජයේ වියදම් සඳහා හැකියාව තහවුරු කරගැනිම, ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක්, රාජ්‍ය මූල්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ සහ පිරිවැය ආපසු අයකරගැනීම පදනම් කරගත් බලශක්ති මිලකරණයෙන් සමන්විත අපේක්ෂා සහිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක්, ණය ප්‍රතිව්‍යුහගතකරණය මඟින් රජයේ මෙහෙයුම් කටයුතු ස්ථාවරකර ගැනීමට අවශ්‍ය මූල්‍යමය කටයුතු ඇතුලු රජයේ ණය ගෙවීමේ හැකියා සකසා ගැනීම, උද්ධමන පීඩාව සමනය කරගැනීම සඳහා ආයෝජන වර්ධන පරිසරයක් ගොඩනඟා ගැනීම සහ අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා හැකියාව ගොඩනගාගැනීම, නම්‍යශීලී විනිමය අනුපාතයක් හඳුන්වා දී මිල ස්ථායිතාවය පිහිටුවීම සහ යළි මූල්‍ය සංචිත ගොඩනගා ගැනීමට බහු පාර්ශ්වීය උපාය මාර්ග සකසා ගැනීම, ආර්ථික වර්ධනය තහවුරු කිරීම වෙනුවෙන්, රජයේ මූල්‍ය අංශයේ ස්ථායිතාවය වෙනුවෙන් ප්‍රතිපත්ති හඳුන්වා දීම, රාජ්‍ය යාන්ත්‍රණයේ දූෂණය පිටුදැකීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම ආදිය සිදුවිය යුතුව තිබිණි. මේ අනුව සියළු පියවර ගැනීම කඩිනමින් සිදු විය. රට මාස කිහිපයක් තුළ දෙපයින් සිට ගන්න තැනට ශක්තිමක් කිරීමටත් මූල්‍ය අරමුදලේ නිර්දේශ සියල්ල වසර දෙකකට අඩු කාලයක දී සම්පූර්ණ කිරීමට ජනාධිපති රනිල්ට හැකි වූයේ ඒ අනුවය. එය ලොවක් මවිත කළ වික්‍රමයක් විය. බංකොළොත් වූ රටක් මෙතරම් කෙටි කාලයක් තුළ ගොඩගත් රටක් මේ පෘථිවි තලයේ එතෙක් මෙතෙක් කාලයකට තිබුණේ නැත.

එහෙත් ජනපති එතැනින් නතර වූයේ නැත. රට සංවර්ධිත රාජ්‍යයක් තෙක් ගෙනයාම වෙනුවෙන් මූල්‍ය අරමුදලේ නිර්දේශ වලින් ඔබ්බට ගිය වැඩපිළිවෙලක් ඔහු සකස් කළේය. මේ වෙනුවෙන් ආර්ථික ක්‍රමයේ ගැඹුරු පරිවර්තනයක් සඳහා වැඩපිළිවෙල රැසක් ක්‍රියාත්මක කර ඇත.

## ජාතියක් ප්‍රතිසංවිධාන කිරීම

රට ඇද වැටුණ තැනින් යම් මාර්ගයයකට ඇද දැමුවාට නැවත අයාලේ යෑම නොවිය යුතුය. ඒ නිවැරදි මාර්ගයේ අවශ්‍ය තැනට යා යුතුය. ඒ වෙනුවෙන් වන 'ජාතික ප්‍රතිසංවිධාන සැලසුම' සකස් කළ අතර ආර්ථික ස්ථාවරත්වය ඉලක්ක කරගත් දීර්ගකාලීන වැඩපිළිවෙලෙහි පදනම එය විය. මෙය ඉදිරි වසර 05 තුළ රටේ ආර්ථිකය පූර්ණ ලෙස ස්ථාවර කරන සහ ඊළග වසර 25 තුළ ශ්‍රී ලංකාව ඉහළ ආදායම් ලබන දියුණු රටක් බවට පත්කරන වැඩපිළිවෙල විය. ඒ අනුව 'ජාතික පරිවර්තන මාර්ග සිතියම' රටට ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශයන්ට සමගාමීව සහ ඉන් ඔබ්බට යමින් රාජ්‍ය මූල්‍ය සහ ප්‍රතිසංස්කරණ, ආයෝජන ප්‍රවර්ධනය, සමාජ ආරක්ෂණ ජාලය, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය පදනම් කරගෙන 2048 දී සංවර්ධිත ශ්‍රී ලංකාව ගොඩනැගීම වෙනුවෙන් වන ගමන් මාර්ගය මෙමගින් ඉදිරිපත් කර ඇත.








# රාජ්‍ය මුදල් විධිමත් කළමනාකරණයට

ආර්ථික වර්ධනය, ජාතික ආදායම, දළ දේශීය නිෂ්පාදනය, උද්ධමනය, විරැකියාව, විදේශ සමඟ ගනුදෙනු ආදිය ඉලක්ක කරගත් සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය නව දැක්මකින් යුතුව සකස් කිරීමට පියවර ගත්තේය. ඒ අනුව රාජ්‍ය සේවය ප්‍රතිසංස්කරණය කිරීම, රාජ්‍ය වියදම් සහ ආදායම් පාලනය උපාය මාර්ග සකස් කළේය. ආර්ථිකය ඉලක්ක කරගත් නව නීති පැනවීම් ලෙස නව පනත් හා පැවැති පනත් සංශෝධනය 45 කට ආසන්න ප්‍රමාණයක් සිදු කළේය.

පැවැති වැරැදි බදු අය කර ගැනීමේ ක්‍රියාවලිය නිවැරදි කරමින් 'දේශීය ආදායම් බදු පනත'ට සංශෝධන ගෙන එමින් රාජ්‍ය ආදායම් පුළුල් කරගැනීමට කටයුතු කළේය. 'කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත' සහ 'ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත', 'සුරාබදු ආඥාපනත පනත' වැනි නීති කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සංශෝධනය කරමින් හා බදු පදනම පුළුල් කරමින් බදු ආදායම් වැඩිකර ගැනීමට පියවර ගෙන තිබේ.

මෙතෙක් පැවැති රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීති වල අඩුපාඩු නිසා 2025 වර්ෂයේ අයවැයත් සමඟ ක්‍රියාත්මක වන පරිදි 'රාජ්‍ය මූල්‍ය නියමයන් රාමුව'ක් ස්ථාපිත කිරීම වෙනුවෙන් නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත හඳුන්වා දීමට පියවර ගෙන ඇත. ඒ සමඟම අතිශය වැදගත් නීතියක් වන රාජ්‍ය ණය කළමණාකරණ පනතද ඉදිරිපත් කළේය. මෙමගින් රජයේ ආදායම් සහ වියදම් වඩාත් විනිවිදභාවයෙන් යුතුව කළමණාකරණ කිරීමට හැකිව තිබේ. මේ අතර 'රාජ්‍ය වත්කම් කළමණාකරණය කිරීමේ පනත' විශේෂීය වේ. එය ජාතික වත්කම් ලේඛනයක් පිළියෙල කිරීමට සහ රාජ්‍ය වත්කම් සම්බන්ධ මධ්‍යගත දත්ත පද්ධතියක් හඳුන්වා දීමටත් හැකි වන පනතකි. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත අරමුදල් ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීම නව රෙගුලාසි පැනවීම් සිදු කරන ලදී. හදිසි හා ප්‍රමුඛ කාර්යයක් වශයෙන් මූල්‍ය ආයතනයන්හි අර්බුද කළමනාකරණ රාමුව සවිමත් කිරීම වෙනුවෙන් 'බැංකු (විශේෂ විධිවිධාන) පනත' හඳුන්වා දීමට පියවර ගත්තේය. නව 'ශ්‍රී ලංකා මහ බැංකු පනත'ගෙන එමින් දේශපාලන ඇඟිලි ගැසීම් වලින් තොරව මහ බැංකුවට ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව තහවුරු කිරීමට කටයුතු කළේය. රජයේ අවශ්‍යතාවයන් අනුව හිතුමතාපයේ මුදල් මුද්‍රණය කිරීම, ණය ගැනීම තහනම් කරන ලදී. රාජ්‍ය අංශයේ දූෂණය පිටු දකින නීතිමය ආවරණයක් වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ නිර්ණායක අනුව පදනම් වෙමින් 'දූෂණ විරෝධි පනත' ගෙන ආවේය, එය ලොව පවතින බලගතුම දූෂණ විරෝධී නීතිමය ප්‍රතිපාදනයන්ගෙන් යුක්තය. ඒ අනුව නව අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිසම් සභාව පිහිටුවනු ලැබූ අතර එමඟින් රාජ්‍ය අංශයේ දූෂණ වංචා අවම කිරීමේ පියවර ගන්නා ලදී.




විදේශ විනිමය අනුපාතයන් විවෘත වෙළඳ පොළ අනුව තීරණ වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තේය. මේ අනුව ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ස්ථාවර කිරීමට හැකිවී ඇත. එමෙන්ම මේ කාලය තුළ ඉහළ ගිය ඩොලරයේ අගය නැවත පහළට ගෙන ඒමටත් රජය ගත් ආර්ථික තීන්දු ඉවහල් විය. ඒ අතරම සියයට 70 ක් තරම් ඉහළ ගිය උද්ධමනය සියයට 1 ක ආසන්න අගයකට ගෙන එමින් තවදුරටත් භාණ්ඩ හා සේවා මිළ ඉහළ යෑම පාලනය කරන ලදී. පොලී අනුපාතයන් පහත හෙළීම සිදුකර මෙරට ව්‍යාපාරික කෂේත්‍රයට නැවත ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමේ පහසුකම් සලසා දෙන ලදී. එමෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යපාර ගොඩ නැංවීම වෙනුවෙන් පහසු ණය යෝජනා ක්‍රම සහ පහසුකම් හඳුන්වා දෙන ලදී. කඩා වැටී තිබු ඩොලර් ආදායම් ලැබෙන මාර්ගක් වන සංචාරක කර්මාන්තය වේගයෙන් වර්ධනය කිරීමට සමත් වූ අතර අපනයනය ආදායම් සහ විදේශ ප්‍රේෂණ ක්‍රමයෙන් වැඩි වීම සිදු විය. මේ අනුව මෙරට ඩොලර් සංචිත ඉහළ ගිය අතර විදේශ ගනු දෙනු අවශ්‍යතා වෙනුවෙන් ඩොලර් හිඟයක් දැන් නැත.






# ආයෝජනයට වැඩි ඉඩක්

පසුගිය කාලයේ ආර්ථික අර්බුද හේතුවෙන් පැනවූ ආනයන සීමා සියල්ලම පාහේ ඉවත් කිරීම මේ වන විට සිදු කර ඇති අතර වාහන ආනයනයද ක්‍රමිකව ඉවත් කිරීමට පියවර ගෙන ඇත. රජයේ ආදායම් අනුව වියදම් නිසි පදනමක් සහිතව පාලනය කිරීම අරමුණු කරගනිමින් ශුන්‍ය පාදක අයවැය (Zero Based Budgeting) ක්‍රමවේදය හඳුන්වා දී රාජ්‍ය ආයතන වියදම් කලමණාකර කිරීමේ නියමු ව්‍යාපෘති මේ වන විට සාර්ථකව සිදුවේ. මෙරට සංවර්ධනය කිරීම සඳහා වන ආර්ථික ඉලක්කයන් රටේ නීතියක් බවට පත් කිරීමට පියවර ගෙන ඇති අතර ඒ වෙනුවෙන වන ආර්ථික පිළිබඳ ජාතික ප්‍රතිපත්ති මාලාව ද ආර්ථික පරිවර්තනය පනත් කෙටුම්පත මගින් ඉදිරිපත් කර ඇති අතර, ඒ වෙනුවෙන් වන ක්‍රියාමාර්ගයන්ද මේවන විට ක්‍රියාත්මකය. කඩා වැටී ඍණ තත්වයට පත්ව තිබූ දළ ජාතික නිශ්පාදනයේ වර්ධනය ජනාධිපති රනිල් වික්‍රමසිංහ ක්‍රියාත්මක කළ ආර්ථික වැඩ පිළිවෙල නිසා යළි වේගයෙන් ඉහළ යෑම සිදු විය. රජයේ වියදම් ආදායමට වඩා අඩු කර ගනිමින් ප්‍රාථමික ගිණුමේ ඉතිරියක් තබා ගැනීමටද සමත් විය. මේ අතර දේශීය සහ විදේශීය ණය ප්‍රතිව්‍යුගතකරණය සාර්ථක කර ගැනීම නිසා. යළි ණය ගෙවීමෙම්හැකියාව සහිත රටක් බවටත් යළි ණය ලාබා ගැනීමට හැකි විශ්වසනීය ආර්ථිකයක් ඇති රටක් බවටත් පත් විය. එනම් බංකොළොත් භාවයෙන් මිදීම සිදු විය. ඉතා කෙටි කළක් තුළ මේ වික්‍රමය සිදු කිරීමට ජනපති රනිල් හැකි වූයේ ඔහුගේ නිවැරදි සහ ජව සම්පන්න බුද්ධිමත් නායකත්වයේ පරිණතභාවය නිසාය. මේ රටක් ලෙස යළි ගොඩනැගීමේ මෙම මූලික පියවරයන් ගන්නා අතරෙහි මෙරට ජනතාවගේ ආර්ථිකය සවිමත් කරවීම වෙනුවෙන් ක්‍රියාමාර්ග රැසක් දියත් කිරීම සිදු විය. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශ යළි ශක්තිමත් කිරීම සඳහා නව ණය යෝජනා ක්‍රමයක් සහ ඔවුන් වෙනුවෙන් ජාතික සංවර්ධන බැංකුවක් ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. ආර්ථික අර්බුදය සමඟ කර්මාන්ත ක්ෂේත්‍රයේ කඩා වැටීම වැලැක්වීමට රජයේ ආධාරය ලබා දුන් අතර නව කර්මාන්ත ඇරැඹීම සඳහා පහසුකම් සලසමින් සහය වීමද කරන ලදී. එහිදී කාන්තා ව්‍යවසාය අංශයේ කාන්තා දායකත්ව වර්ධනය වෙනුවෙන් තවත් වැඩපිළිවෙලක් දියත් කර ඇත. ඒ අතර ව්‍යවසායක කාන්තාවන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම හා ඔවුන්ගේ සේවා අවශ්‍යතාව වෙනුවෙන් "සුහුරු ලිය" වැඩසටහන යටතේ මේ වන විටත් කාන්තාවන් 17,000කට ව්‍යවසායක පුහුණුව ලබා දීමට ද රජය පියවර ගෙන තිබේ. තරුණ ව්‍යවසායකත්වය ගොඩ නැංවීම වෙනුවෙන් ක්ෂේත්‍ර ගනනාවක ක්‍රියාමාර්ග රැසක් දියත් කළේය. විශේෂයෙන්ම රටේ ආර්ථිකය ජව සම්පන්නව ක්‍රියාත්මක වීමේ දී තරුණ ජවයේ අවශ්‍යතාවය ජනාධිපතිවරයා නිරන්තරයෙන් අවධාරණය කරමින් මෙම වැඩපිළිවෙල දියත් කළේය.

දේශිය සහ විදේශීය ආයෝජන ප්‍රවර්ධනය සඳහා පියවර ගනනාවක් මේ වන විට ගෙන තිබේ. විශේෂයෙන්ම රටේ සංවර්ධනය වෙනුවෙන් වඩාත්ම වැද්ගත් වන ක්ෂේත්‍රය වන්නේ ආයෝජනයන්ය. නමුත් ඒ සඳහා වන බාධක රැසක් පැවැති අතර මේ වන විට නෛතිකම වශයෙන් වන බාධාවන් සහ ආයෝජන ආකර්ෂණය වෙනුවෙන් පියවර ගනනාවක් ගෙන තිබේ. ඒ සඳහා ද ආර්ථික පනත් කෙටුම්පත මගින් නව ආයතන ව්‍යුහයක් ගොඩනැඟීම ඇතුළු යෝජනා රැසක් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමේදී ආයෝජකයන් මුහුණ දෙන දුෂ්කරතා සහ ගැටලු හඳුනාගෙන ඒවා නිරාකරණය කිරීම, ආයෝජන දිරි ගැන්වීම, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමටත් හැකි වන පරිදි රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ජාතික නියෝජිතායතනය පිහිටුවීමට පියවර ගෙන තිබේ. ශ්‍රී ලංකාව තුළ වෙළෙඳ කටයුතු ආශ්‍රිත ක්‍රියාවලිය සරල කිරීම සහ කඩිනම් කිරීම සඳහා ජාතික යෝජනාවලියක් කඩිනමින් සකස් කිරීමට පියවර ගෙන ඇත. ජාතික වෙළෙඳ පහසුකම් සැපයීම පිළිබඳ ලේකම් කාර්යාලය පිහිටුවා 2025-2030 කාලය තුළ සපුරාගත යුතු කාර්යයන් කඩිනමින් ක්‍රියාවට නැංවීම ආරම්භකර ඇත. තොරතුරු තාක්ෂණය, සූර්ය සහ සුළං විදුලි බලාගාර, ඉන්ධන පිරවීම, ඛනිජ සැකසුම යනාදී ක්ෂේත්‍ර වල ආයෝජන ගනනාවක් මේ වන විටත් ලැබී පවතී. එමෙන්ම ආර්ථි අර්බුද නිසා නැවැතී තිබූ ජපානය ඇතුළු මෙරටට ආධාර කරන රටවල් කණ්ඩායමේ ව්‍යපෘති යළි ආරම්භ කිරීමට සිදු ඇත. ඒ අනුව කොළඹ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය යළි ආරම්භ වීම විශේෂිතය. එමෙන්ම කොළඹ වරාය නගරය සඳහාද විදේස් ආයෝජන රැසක් ලබා ගැනීමට හැකි විය.

## ජංගම ගිණුමේ ශේෂය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව





අපනයනය ඉලක්ක කරගත් නිශ්පාදන ආර්ථිකය දියුණු කිරීම ජනාධිපතිවරයා වැඩි අවධානයක් යොමු කිරීම සිදු විය. මේ වෙනුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරණය. කෘෂි නවීකරණය සහ ආනයන භාණ්ඩ නිශ්පාදනය ඉලක්ක කළ විදේශ ආයෝජන දියුණු කිරීමට ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබෙන අතර රාජ්‍යයන් ගනනාවක් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් වලට එළැඹීම හරහා අපනයන වර්ධනය කිරීමට ද පියවර ගෙන තිබේ. ආනයන වියදම් සහ අපනයන ආදායම් පරතරය අඩු කරගැනීම ද ඉලක්කයකි. ඒ අනුව අක්‍රියව පැවැති සිංගප්පූරුව සමග වන නිදහස් වෙළඳ (SLSFTA) යළි සක්‍රීය කිරීම, ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLFTA) අත්සන් කිරීම සිදු විය. ශ්‍රී ලංකාව සහ චීනය අතර නිදහස් වෙළඳ ගිවිසුම, ඉන්දුනීසියාව සමඟ වරණීය වෙළඳ ගිවිසුම අත්සන් කිරීමේ එකඟතාවයන්ට පැමිණ ඇත. ඉන්දියාව සමඟ යෝජිත ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම (ETCA) සාකච්ඡා සාර්ථකව තිබේ. ඒ සමඟම ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය, බංග්ලාදේශය, නවසීලන්තය, ජපානය, මැලේසියාව අතර නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා පියවර ගෙන ඇත. මේ අතර ඉහළ මට්ටමේ ආර්ථික නිදහස්කරණයක් සාක්ෂාත් කර ගැනීම සඳහා වන අරමුණ ඇතිව ශ්‍රී ලංකාව චීනය, තායිලන්තය සහ බෙංගාල බොක්ක ආශ්‍රිත බහු ආංශික, තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව (BIMSTEC) සඳහා වූ වෙළඳ ගිවිසුම සහ ශ්‍රී ලංකාව කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වයට (RCEP) ඇතුලත් වීමට ද අවශ්‍ය කටයුතු සිදු කළේය. ආර්ථික වශයෙන් වේගවත් වර්ධනයක් අත්පත් කරමින් තිබෙන මෙම දකුණු හා අගිනිදිග කලාපවල වර්ධනයන් සමඟ එහි වාසිය මෙරටට ලබා ගැනීම වෙනුවෙන් තවත් වැඩපිළිවෙල රැසක් ක්‍රියාත්මක වෙමින් තිබේ. ඊට සමඟාමීව මෙම කලාපයේ ප්‍රධානතම නාවික හා ගුවන් කේන්ද්‍රස්ථානය බවට මෙරට පත්කිරිම වෙනුවෙන් අවශ්‍ය පියවර ගනනාවක් ගත්තේය. ඒ වෙනුවෙන් ඉන්දියාව ප්‍රමුඛව කලාපීය සහසම්බන්ධතා සහිත ආර්ථිකය සහයෝගිත්වය වර්ධනය කිරීමේ හවුල්කාරිත්ව ගිවිසුම අත්සන් කිරීම ද සිදුව ඇත. අනාගත කලාපීය වර්ධනය පදනම් කරගෙන කොළඹ වරාය, කලාපයේ ප්‍රධානතම සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම වෙනුවෙන් ඩොලර් මිලියන 150ක ආයෝජනයක් සහිතව කොළඹ ජාත්‍යන්තර බහාළු පර්යන්ත (CICT) ඉදිකිරීමට අවශ්‍ය පියවර ගත්තේය. වරාය බටහිර ජැටිය මේවන විට විදේශ ආයෝජන සහිතව ඉදි වෙමින් තිබේ. නැගෙනහිර ජැටියේ සංවර්ධන කටයුතුව අවසන් වෙමින් තිබේ. කොළඹ වරාය දකුණු ආසියාතු කලාපයේ ප්‍රධාන කේන්ද්‍රීය වරාය වන අතර එහි උතුරු කොටස සංවර්ධනය කිරීමේ නව වැඩපිළිවෙලට අදාල සක්‍යතා අධ්‍යයනයන් ද අවසන් කර ඇත. මේ අතර ජාත්‍යන්තර ප්‍රවණතා සමඟ සමඟාමීව, වාණිජ සමථකරණය සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට 'සමථකරණය (සිවිල් සහ වාණිජ ආරවුල් නිරාකරණය) පනත' ද සමථකරණය තුළින් ඇති වන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම සඳහා 'සමථකරණය පිළිබඳ සිංගප්පූරු සම්මුතිය පනත' ද සකස් කළේය. මේ ආදී වශයෙන් ආර්ථික ක්ෂේත්‍රයේ ගත් ක්‍රියාමාර්ග නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකතන ද අභිබවා ජයග්‍රහණ රැසක් අත්පත් කරගැනීමට මේ ගෙවුණු වසර දෙක තුළදී හැකි විය. ජනාධිපති රනිල් මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක කරණ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල අඛණ්ඩව ඉදිරි වසර 5 තුළවත් ක්‍රියාත්මක වීම මෙරට ඉක්මනින් යථා තත්වයට පත් වීම සහ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් ඇති එකම වැඩ පිළිවෙල වේ.


























# රාජ්‍ය සේවය ශක්තිමත්...

මේ අතර රාජ්‍ය සේවය කාර්යක්ෂම සේවාවක් ලෙස ගොඩනැගීමට අවශ්‍ය ක්‍රියාමාර්ග රැසක්ද ගනු ලැබීය. එසේම ලක්ෂ 14 වන සියළුම රාජ්‍ය සේවකයන් වෙනුවෙන් රු 10,000 ක මාසික දීමනාවක් ලබා දීමට ද ජනාධිපති රනිල් කටයුතු කළේ රට ආර්ථික අර්බුදයෙන් කරවටක් ගිලී සිටියදීය.

ඒ අතර රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින් වෙනුවෙන් වැඩි ප්‍රතිලාභ සහිත 'ජාතික දායකත්ව විශ්‍රාම අරමුදල' නමින් නව අරමුදලක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත.

රාජ්‍ය අංශයේ කටයුතු කාර්යක්ෂම සහ නිවැරදි කිරීම වෙනුවෙන් ඩිජිටල් තාක්ෂණික යාන්ත්‍රණයක් යොදාගැනීමට වැඩි අවදානයක් යොමුකර ඇති අතර කෘත්‍රිම බුද්ධි භාවිතය රට තුළ ප්‍රවර්ධනය කිරීමට ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සමන්විත ජනාධිපති කාර්ය සාධක බලකායක් දැනටම ක්‍රියාත්මකය. ඩිජිටල් ආර්ථික නියාමන ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමේ වැඩසටහන ආරම්බ කර ඇති අතර ශ්‍රී ලංකාව කඩිනමින් ඩිජිටල්කරණයකට ගෙන යෑම සඳහා වන DIGIECON SRI LANKA 2023 - 2030 වැඩසටහන දියත් කළේය.

පාසල් සඳහා ෆයිබර් තාක්ෂණය ලබාදීම, ස්මාර්ට් පංතිකාමර ලබා දීම, ගමට සන්නිවේදනය වැඩසටහන යටතේ වසර එකහාමාරක් ඇතුළත සන්නිවේදන තාක්ෂණ පහසුකම් මුළු දිවයිනටම ලබාදීම, කෘෂිකර්මාන්තට ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම වැනි පියවරයන් රැසක්ද දියත් කර තිබේ.

සයිබර් අපරාධ වළක්වා ගැනීමේ අරමුණින් සයිබර් ආරක්ෂණ පනත සැකසුවේය. 'දත්ත ආරක්ෂණ පනත' මගින් ස්ථාපිත කිරීමට යෝජිත අධිකාරිය සම්බන්ධ කටයුතු ආරම්භකර තිබේ. යුගයේ දැඩි අවශ්‍යතාවයක්ව තිබූ සමාජ මාධ්‍ය නියාමන පනත හඳුන්වා දීම ද මෙම කාලය තුළ සිදු විය.







# පාඩු ලබන ව්‍යාපාර දැන් පරණ කතාවක්

රාජ්‍ය ව්‍යවසායයන් හි කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොපවැතීමත්, දිගින් දිගටම පාඩු ලැබීමත් එම පාඩු රාජ්‍ය ආදායම් මඟින් පියවීමටත් සිදුවීම රටේ ආර්ථිකය නැංවීමෙහි බරපතල ලෙස බලපෑම් කරන බව රහසක් නොවේ. මේ නිසා පැරණි අසාර්ථක ක්‍රමවේදය වෙනුවට රජය ව්‍යාපාර කිරීමෙන් ඉවත් විය යුතු බවට ප්‍රතිපත්තිමය තීරණය ගන්නා ලදී.

රජය විසින් ව්‍යාපාර නොකළ යුතු බවට වන රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව පෞද්ගලික අංශය වෙත ආර්ථික වර්ධනයේ වැඩිම බර තබනු ඇත. රජය විසින් ඊට පහසුකම් සලසමින් ඒ නියාමනය කිරීම පමණක් කරනු ඇත. කිසිදු අවස්ථාවක රාජ්‍ය ව්‍යාපාර පාඩු මහජනතාවගේ හිස මතට නොපැටවිය යුතුය යන ස්ථාවරය මත අසීරු, නමුත් කළ යුතු ප්‍රතිව්‍යුහගතකරන ක්‍රියාමාර්ග වෙත අවතීර්ණ වීමට කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත.

මේ අනුව රාජ්‍ය ව්‍යවසායයන් ගනනාවක් ප්‍රතිව්‍යුගතකිරීම සඳහා පියවර ගත්තේය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම යන සමාගම් දෙකට අමතරව චීනයේ සිනොපෙක් (Sinopec), ඕස්ට්‍රේලියාවේ යුනයිටඩ් පෙට්‍රෝලියම් (UnitedPetroleum), එක්සත් ජනපදයේ ආර්එම් පාර්ක්ස් (RM Parks) යන නව සමාගම් වෙත මෙරට ඉන්ධන වෙළඳපොළට ඇතුළු වීමේ අවස්ථාව ලබා දුන්නේය. මෙමඟින් යළි ඉන්ධන හිඟය ඇති නොවීමටත් තරගකාරී මිළකට පාරිභොගිකයන් වෙනුවෙන් අඛන්ඩ සේවයක් ලබා දීමටත් පියවර ගෙන ඇත. එමෙන්ම ලංකා ඛනිජ තෙල් සංස්ථාව මේවන විට ලාබ ලබන ආයතනයක් බවට පත් කිරීමට ද හැකිව ඇති අතර ඒ අනුව ඉන්ධන මිළ ක්‍රමයෙන් අඩු කිරීමත් සිදු විය.

ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පද්ධතිය නවීකරණය කර නව පිරිපහදුවක් ගොඩනැගීමේ කටයුතුද සිදු වෙමින් තිබේ. මීට අමතරව ඉන්දියාවේ නාගපට්නම් සහ කොළඹ යා කරමින් බහු නිෂ්පාදන තෙල් නල මාර්ගයක් සහ ස්වභාවික වායු නල මාර්ගයක් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කිරීම සිදු විය. චීනයේ සිනොපෙක් (Sinopec), සමාගමට ඩොලර් බිලියන 4.5 ආයෝජනයක් සහිත හම්බන්තොට නව ඉන්ධන පිරිපහදුවක් ගොඩනැඟීමට අවශ්‍ය අනුමැතිය ලබා දීමද ගෙවුණු වසර දෙක තුළදී සිදු විය. එමෙන්ම තවත් පාඩු ලැබූ රාජ්‍ය ආයතනයක් වන විදුලි බල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට සමගාමීව, විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහ ආර්ථිකයට අත්‍යවශ්‍ය වන දීර්ඝ කාලයක් ප්‍රමාද වූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කඩිනමින් කිරීමට පියවර ගත්තේය. මේ අනුව මෙරට විදුලි උත්පාදනයෙන් සියයට 70 ක් පමණ පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ලබා ගැනීමට සැලසුම් කර ඇත. මේ වන විටත් ඉහළ ගිය විදුලි බිල් ගාස්තු අඩු වීමේ වාසිය ජනතාවට ලැබී තිබේ. එමෙන්ම විදුලි බල මණ්ඩලය ලාබ ලබමින් විදුලිය අඩුම ගාස්තුවකට ලබා දීමටත් සමත්ව තිබීම විශේෂ තත්වයකි. මේ අතර න්‍යෂ්ඨික බලය, බලශක්ති ප්‍රබවයක් ලෙස යොදාගැනීම සමබන්ධයෙන් රජය ගෙන තිබෙන තීරණය අනුව ඒ සඳහා අභිලාශ කැඳවීම සිදු කර ඇති අතර, විදේශ සමාගම ගනනාවකින් යෝජනා ලැබී ඇත. එමෙන්ම නෂ්ඨික බලාගාරය ඉදිකිරීම සඳහා ප්‍රදේශ හඳුනා ගැනීම සහ ඒ සම්බන්ධ අධ්‍යනයන්ද ආරම්භ විය.





# අනාගත අපේක්ෂා වෙනුවෙන්

කෘෂිකර්මාන්තය අඩු පිරිවැයකින්, වැඩි අස්වැන්නක් ලබා ගත හැකි ලාබ දායක සහ අපනයනය කේන්ද්‍රකරගත් ව්‍යපාරයක් ලෙස සංවර්ධනය කිරීම වෙනුවෙන් නවීකරණයට පියවර ලනු ලැබීය. නව පොහොර ප්‍රතිපත්තිය හේතුවෙන් වසර 10 කට පසු කුඹුරු සහ අනේක වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් ලක්ෂ 2ක් පමණ වැඩි විය. ඇතැම් නොමිලේ ලබා දීමටත් පොහොර සහනාධාර ක්‍රමයට ලබා දීමත් සහ මූල්‍ය ආධාරයන් ලබා දීම සිදු කළේය. වතුකරයේ නිවාස ගැටලුව විසඳීමට ජනාවාස ඇති කිරීම හා තේ, රබර් සහ පොල් කර්මාන්ත ආශ්‍රිතව මතුව ඇති ගැටළු නිරාකරණයට පියවර ගැනීමත් වතු සේවක ජනතාවගේ දෛනික අවම වැටුප ලෙස රු 1700 ක් ලෙස ඉහළ දැමීමත් සිදු කළේය.

අපනයනය ඉලක්ක කරගත් කෘෂි නිෂ්පාදයන් බිහි කිරීම, දේශීය ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම හා තරුණ පිරිස, "නව තාක්ෂණය හා බැඳුනු කෘෂි ව්‍යවසායකයින්" බවට පත් කිරීම යන අරමුණු සපුරා ගැනීම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල සියලු ආයතන නියාමනය කිරීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රය නව්‍යකරණය කිරීමට ජාතික ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීමට පියවර ගත්තේය.





# සෞඛ්‍යමත් රටක්

අත්‍යවශ්‍ය ඖෂධවල මිල අඩු කිරීම සහ ඖෂධ හිඟය වැළැක්වීමට පියවර ගනු ලැබීය. තවදුරටත් ඖෂධ හිඟය පිළිබඳ ගැටළු නිරාකරණය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත (හළුස්) සංශෝධනයට ද පියවර ගත්තේය. පුරවැසියන්ට සෞඛ්‍ය සම්පන්න ආහාර පරිභෝජනය කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලසන ආරක්ෂිත ආහාරමය පරිසරයක් පැවතීම ඇතුළුව ජනතාවගේ පෝෂණ තත්ත්වය යහපත්ව පවත්වාගෙන යාම කෙරෙහි බලපාන විවිධාකාර වූ ගැටලුවලට සාර්ථකව විසඳුම් ලබා දීමේ අරමුණින් ජාතික පෝෂණ ප්‍රතිපත්තියක් සකස් කරනු ලැබුවේය. ගෘහස්ත අපද්‍රව්‍ය හා මානව අපද්‍රව්‍ය මෙන්ම ආයතනික, වාණිජ හා කර්මාන්ත අපද්‍රව්‍ය සුරක්ෂිත කළමනාකරණය මෙන්ම ඒවායේ සුරක්ෂිත එක්රැස් කිරීම, පිරිපහදු කිරීම, බැහැර කිරීම හා ඒ ආශ්‍රිත සෞඛ්‍ය පිළිවෙත් සනීපාරක්ෂාව වෙනුවෙන් සනීපාරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා සනීපාරක්ෂක ප්‍රධාන සැලැස්ම පිළියෙල කර ඇත. ශ්‍රී ලංකාවේ නිදන්ගත බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගික රාමුව ද මේ වන විට සකසා අවසන්ය.

# ගමෙන් රටේ සංවර්ධනට

පාර්ලිමේන්තු විමධ්‍යගත අරමුදල් ලෙස රුපියල් බිලියන 11කට වැඩි මුදලක් මුදාහරිමින් ග්‍රාමීය සංවර්ධන කටයුතු වේගවත් කළේය. කඳුකර දශකය වැනි වැඩසටහන් හරහා රටේ කඳුකර ප්‍රදේශ විශේෂ සංවර්ධනයකට පියවර ගනු ලැබීය. 2015 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරනු ලැබ ඇති බස්නාහිර ප්‍රදේශ මහානගර ප්‍රධාන සැලැස්ම ඉදිරියට ගෙනමින් ඒ ක්‍රියාත්මක කිරීම සඳහා බස්නාහිර පළාතම එක් මහානගරයක් ලෙස ගොඩනැගීමට සැලසුම් කර ඇත. ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කරමින්, 'උරුමය' වැඩසටහන මඟින් රජයේ ඉඩම් භුක්ති විඳිමින සිටි ජනතාවට එම ඉඩම් වල සින්නක්කර අයිතිය ලබාදීම සිදු කළේය. මෙරට රාජ්‍ය නායකයකු විසින් ගත් විප්ලවීයම ක්‍රියාමාර්ගය ලෙස එය ඉතිහාසගත වෙනු ඇත. එමගින් පවුල් ලක්ෂ 22 කට තමන්ගේම ඉඩමක උරුමය හිමිවිය. 'රන්දොර' වැඩසටහන ක්‍රියාත්මක කිරීම නිසා රජයේ නාගරික මහල් නිවාසවල මාසික ගෙවීමේ පදනමෙන් ජීවත් වුණු පවුල් 50,000 කට එම නිවාස අයිතිය හිමිකර දීම සිදුකළේය. එමෙන්ම රජයේ තවත් නිවාස ව්‍යාපෘති ගණනාවක්ද මේ වන විටත් ආරම්බ කරමින් ඇත. මෙරට සෑම පුරවැසියකුම ඉඩමක නිවාසයක උරුමකරුවක් විය යුතු බව ජනාධිපතිවරයාගේ අදහසය. අනූව දශකයේ දී අතරමඟ නතර වී තිබුණු 'බිම්සවිය' වැඩසටහන යටතේ මිලියන 12 ක් පමණ වූ ඉඩම් කට්ටි බෙදාදීමට අපේක්ෂා කළත් එලෙස පවරා ඇත්තේ ඉඩම් කට්ටි මිලියනයකට ආසන්න ප්‍රමාණයක් පමණි. ඊට බලපෑ නෛතික හේතු ඉවත් කර එම
වැඩසටහන ක්‍රියාත්මක කිරීමටද පියවර ගැනීම සිදු කළේය. කාලීන සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි මෙරට ඉඩම් සම්බන්ධයෙන් පවතින අණ පනත් සංශෝධනය කිරීමට පියවර ගෙනද ඇත. ජාතික ඉඩම් සභාවක් පිහිටුවීම සහ ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කිරීම සිදුවිය.

# නව ලෝකය ජය ගන්න අධ්‍යාපනය

අධ්‍යාපන ක්ෂේතරය නව ලෝකයට ගැලපෙන හා ඉදිරි දශකයට ගැලපෙන ලෙස ලෙස ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගනු ලැබීය. අදාළ සියලු පාර්ශ්වයන්ගේ දායකත්වයෙන් නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවක්

සකස් කිරීමට අදාල කටයුතු ආරම්භ කෙරිණි. විශ්වවිද්‍යාල පද්ධතිය නවීකරණයට අවශ්‍ය පියවර ගන්නා අතර රජයට අයත් නොවන විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට රජයෙන් ණය සහන ලබාදීමට තීරණය කළේය.

ඉතිහාසය පිළිබඳ ආයතනය, ආර්ථික විද්‍යා සහ වෙළඳ ආයතනය, රජය සහ රාජ්‍ය ප්‍රතිපත්ති විශ්වවිද්‍යාලය, කෘෂි තාක්ෂණ විශ්වවිද්‍යාලය, දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය, ක්‍රීඩා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා ජාතික හෙද විශ්වවිද්‍යාලය, මහා විහාර ථෙරවාදය පිළිබඳ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය පිහිටුවාලීමට මූළික කටයුතු ආරම්බ කර ඇති අතර ඒමගින් මෙරට අධ්‍යාපන විප්ලවයකට මුල් පිරීය. ඒ අතරම ශ්‍රී ලංකාව ජාත්‍යන්තර අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් වීමද සිදු වෙනු ඇත.

## යුක්තිය තහවුරු කිරීම

අධිකරණ සහ නීති ක්ෂේත්‍රයේ පැවැති ගැටළු කඩිනමින් නිරාකරණය කර යුක්තිය පසඳලීමේ ක්‍රියාවලිය වඩාත් වේගවත් කළේය. මෙම ක්ෂේත්‍රවට අදාලව අණ පනත් 40 කට වැඩි ප්‍රමාණයක් සංශෝධනය කිරීම හා නව නීති පැනවීම සිදු කළේය. ඒ අතර 'අධිකරණ සංවිධාන පනත' සංශෝධන කිරීම මගින් අධිකරණයේ ගොඩ ගැසී ඇති නඩු සංඛ්‍යාව අවම කිරීමේ අරමුණින් මහාධිකරණ විනිසුරුවන් ගණන ඉහළ නැංවීමට පියවර ගත්තේය. අන්තර්ජාතික වශයෙන් පිළිගත් හොඳම ප්‍රමිතීන් හා පරිචයන් අනුගමනය කිරීමට හැකි වන පරිදි වඩාත් යෝග්‍ය විධිවිධාන ඇතුළත්ව අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහාය වීමේ සහ ආරක්ෂා කිරීමේ නව පනත හඳුන්වා දීම සිදු කළේය. අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම සිදු කර ඇති අතර කවර තරාතිරමක්, පක්ෂග්‍රාහිත්වයක් නොසලකා නීතිය නියමාකාරයෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් සැලසීම සිදු කර ඇත.

## ප්‍රජාතන්ත්‍රවාදය යළි ශක්තිමත් කිරීම

ආර්ථිකය ඇද වැටුණු වළෙන් ගොඩගැනීම මෙන්ම ආර්ථිකය නැවත නිවැරදි මාර්ගයට ගැනීම සහ ඉලක්කයක් වෙත රැගෙන යාමට අවශ්‍ය පියවරය ගන්නා අතරේ දේශපාලනික සමාජීය සංස්කෘතික වශයෙන් ඇති ගැටලු නිරාකරණය සහ එය රටේ අනාගත ජයග්‍රහණයන් වෙනුවෙන් ඊට සරිලන ලෙස සකස් කිරීමත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ පියවර ගත්තේය. පසුගාමී ආකල්ප, පටු දේශපාලන මතවාද රටේ ආර්ථික සංවර්ධනයට බරපතල හානියක් කර තිබීම මත ජනාධිපතිවරයා අපේක්ෂා කරන ඉලක්කය වෙත යෑමට නම් දේශපාලනික සමාජීය තත්වයන්ද ගැඹුර ප්‍රතිසංස්කරණයන්ට ලක් විය යුතුව තිබිණි. එය අනිවාර්යයක් විය. ඒ අනුව ජනාධිපතිරයා මේ ගෙවුණු දෙවසරක කාලය තුළ ගත් ක්‍රියාමාර්ග වුව ලෙහෙසියෙන් පහසුවෙන් ගත් ඒවා නොවේ.

විශේෂයෙන්ම විපක්ෂ කණ්ඩායම් වලින් දිගින් දිගටම එල්ල වූ පදනම් විරහිත විරෝධයන්, බාධා කිරීම්, කඩාකප්පල් කිරීම් මතින් මේ ගමන් පැමිණ තිබේ. ජනාධිපති රනිල් රට බාර ගත්තේ බරපතල දේශපාලන ව්‍යාකූලත්වයකින් රට පීඩාවට පත් මොහොතකය. විශේෂයෙන් පුරවැසි අරගලයට මුවා වී සිදු කළ දේශපාලනික කුමන්ත්‍රණ මඟින් රට අරාජික කිරීමේ උත්සාහයන් තිබිණි. ජනාධිපති රනිල් මෙය මුළුමණින්ම පරාජය කිරීමට දැඩි පියවරයන් ගත් අතර යළි එවැනි උත්සාහයන් සඳහා ඉඩ ප්‍රස්ථා අහෝසි කිරීමද කළේය. එවකට ආණ්ඩු පක්ෂයේ බලය හිමිකරගෙන සිටි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ (පොහොට්ටුවේ) දේශපාලනඥයන්ට සහ පාක්ෂිකයන්ට එරෙහිව දියත්ව තිබූ ප්‍රචණ්ඩකාරී ප්‍රහාරයන්, දේපොළ විනාශ කිරීම් ආදිය වැලැක්වීමට පියවර ගත් අතර ඕනෑම දේශපාලන මතවාදයක් දරන්නෙකුට දේශපාලනය කිරීමේ නිදහස, අදහස් ප්‍රකාශනයේ නිදහස තහවුරු කිරීමට කටයුතු කරන ලදී.

රටේ නීතිය අරගලයේ නීතිය යැයි කියමින් ප්‍රචණ්ඩත්වය වැපිරූවන් මර්දනය කර රටේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පරිසරය යළි පිහිටුවීම සිදු කළේය. එදා එය නොවන්න මේ රට ත්‍රස්ත ග්‍රහණයකට හසුව විනාශ වූ රාජ්‍යයක් තත්වයට පත් වීම ඉඩ තිබිණි. එහෙත් ජනාධිපති රනිල් තමන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පැවරී තිබූ විධායක බලතල හිතුවක්කාරව පාවිච්චි කිරීමේ පිළිවෙත පසෙකළා ජනතා පරමාධිපත්‍යය ව්‍යවස්ථානුකූලව ක්‍රියාවට නැංවමින්, සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයේ සහජ ලක්ෂණයන් සක්‍රීය කරමින්, ඊට ඉහළම ආදර්ශය සැපයීම සිදු කළේය. ඒ වෙනුවෙන් 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය ගෙන එමින් ජනාධිපතිධුරයේ විධායක බලතල ප්‍රමාණයක් ඉවත්කර ඒ වගකීම් පාර්ලිමේන්තුවට පවරණ ලදී.

ජාතික සභාව සහ ආංශික කාරකසභා ක්‍රමය ඇති කරමින් විපක්ෂයද සාමාන්‍ය ජනතාවද ආණ්ඩුකරණයට සම්බන්ධ කරගෙන වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් ගොඩගමින් ඒවා ක්‍රියාත්මක තලයට ගෙන ආවේය. ජනසභා ක්‍රමය ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිද සිදුව තිබෙන අතර එමගින් ප්‍රාදේශීය සංවර්ධනය ගැන තීන්දු තීරණ එම ප්‍රදේශ වල ජනතාවයටම ගැනීමේ හැකියාව ඇති කරයි. මැතිවරණ ක්‍රමයේ වෙනසක් මෙන්ම මහජන නියෝජිතයන්ට වැඩි වැදගත්කමක් මෙන්ම එය අදූෂිත කිරීම වෙනුවෙන් පියවර ගෙන තිබේ.

මැතිවරණයකදී ඒ ඒ පක්ෂයකට වියදම් කළ හැකි මුදල් හා වත්කම් සම්බන්ධයෙන් දැඩි නීති පනවමින් 'මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත' ගෙන එනු ලැබීය. දේශපාලනය තුළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ තරුණ හා කාන්තා නියෝජනය සඳහා අවස්ථාව සලසා දීම වෙනුවෙන් නව නීති සංශෝධනයන් ගෙන අවේය.

එසේම ජනවාර්ගික ගැටළු අවසන් කිරීම සඳහා සාධනීය පියවරයන්ට ගිය අතර එමඟින් සියළු ජන වර්ගයයන්ට සැකයකින් තොරව රාජ්‍යයේ අභිවෘද්ධිය වෙනුවෙන් සේවය කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් වෙනු ඇත.

2024 07 21

## පාරිසරික යහපැවැත්ම

වර්තමානයේ සිදු වන අවිධිමත් ඉඩම් පරිහරණ හා කෘෂිකාර්මික පිළිවෙත්, අවිචාරවත් සහ අපද්‍රව්‍ය බැහැරලීම් හා ස්වභාවික සම්පත් හානි වීම වැනි විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසර පද්ධති වලට වන හානිය අවම කිරීම, සමාජ ආර්ථික යහපැවැත්ම සහ ජීවත්විය හැකි පරිසරයක් උදෙසා වන පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ ස්ථාපිත කිරීම මඟින් සෞඛ්‍ය සම්පන්න, සුරක්ෂිත සහ සංරක්ෂිත පරිසරයක් හා ආර්ථිකයක් සහතික කිරීම පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හඳුන්වා දීමට ද කටයුතු ආරම්බ කෙරිණි.

දේශගුණික විපර්යාස අවම කිරීම වෙනුවෙන් වන ජාත්‍යන්තර වැඩපිළිවෙලට සමගාමී දේශිය වැඩසටහන් රැසක් ද ක්‍රියාත්මක කළේය. දේශගුණික විපර්යාස පිළිබඳ පනත, වනාන්තර ප්‍රතිරෝපණය සහ වෘක්ෂ ආවරණ පනත, ජීවමාන අස්ථිත්ව පනත, සාගර සම්පත් ගවේෂණය සහ කළමනාකරණය සඳහා නීති, මුතුරාජවෙල (සංරක්ෂණය) පනත, අන්තරායක සත්ව පනත, ආදීය ඉදිරිපත් කළ අතර ඒ තුළ පරිසරයත් සත්ව ආරක්ෂාව සේම මානව ජීවිත ආරක්ෂාව සම්බන්ධයෙන් වන නව නීති අඩංගු කර ඇත. දේශගුණික අවදානම්වලට මුහුණ දෙනු ලබන හා සංවර්ධනය වෙමින් පවතින රටවල් සම්බන්ධයෙන් අලාභ හා හානි සඳහා මූල්‍ය සම්පාදනය වේගවත් කිරීමට 'දේශගුණික යුක්ති සංසදය' පිහිටුවීම් ජනාධිපතිවරයා විසින් ජාත්‍යන්තරයට යෝජනා කරනු ලැබූ අතර ඒ සම්බන්ධයෙන් ලෝකයේම පැසසුමට ජනාධිපතිවරයා ලක් විය. හරිත ආර්ථිකයක් සඳහා යොමු වීම සම්බන්ධයෙන් වන රජයේ අපේක්ෂාව ජනාධිපතිවරයා ප්‍රකාශ කර ඇති අතර ඒ සඳහා වන ක්‍රියාමාර්ග රැසක්ද ගෙන ඇත.

## සමාජීය සහ සංස්කෘතික ගොඩනැංවීම්

සෑම පුරවැසියෙකුටම ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ දේශපාලන යන ක්ෂේත්‍රයන් තුළ සම අවස්ථා ඇති කිරීම, අනන්‍යතාව සුරක්ෂිත කිරීම, විවිධත්වය ගෞරවයට සහ ඇගයීමට පාත්‍ර කරනු ලබන සමාජයක් ඇති කිරීම සහ සියලුම ප්‍රජාවන්ට සමගියෙන් සහ සහයෝගිතාවයෙන් එක්ව ජීවත් විය හැකි සමාජයක් බිහි කිරීම අරමුණු කර ගෙන ගැටළු රාශියක් සඳහා විසඳුම් ක්‍රියාත්මක කිරීමට මේ ගෙවුණු කාලය තුළ ජනාධිපතිවරයා මැදිහත් විය. 'ළමා (අධිකරණමය ආරක්ෂාව) පිළිබඳ පනත', සමාජ සාධාරණත්වය පිළිබඳ කොමිෂන් සභා පනත, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ඊට අදාල පනත් ගෙන ආවේය. විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්ගේ ආරක්ෂණ පනත, ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත, ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත ද හඳුන්වා දෙන ලදී. ජාතික සමගිය සහ සංහිඳියාව වෙනුවෙන් සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම ක්‍රියාත්මක කිරීම, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය නිසි පරිදි පවත්වාගෙන යෑමද සහ වන්දි ගෙවීමේ කාර්යාලය ස්ථාපිත කරීම වැනි පියවරයන් ගෙන තිබිණි. අන්තරායක ඖෂධවලට ඇබ්බැහි වූවන්, පෙර සටන්කරුවන්, ප්‍රචණ්ඩකාරී, අන්තගාමී කණ්ඩායම් වල සාමාජිකයින් පුනරුත්ථාපනය කිරීමට 'පුනරුත්ථාපන කාර්යංශය පනත' සම්මත කළේය. එමෙන්ම මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීම හා ජාවාරම් මර්දනය වෙනුවෙන් නව නීති පැනවීම සිදු කළේය. අයිස් නම් මත්ද්‍රව්‍යය සම්බන්ධයෙන් චෝදනා එල්ල වන ඕනෑම පුද්ගලයකුට මරණ දණ්ඩනය පැනවීමේ බලය ලැබෙන සේ නීති සංශෝධනය කරන ලදී. ශ්‍රී ලංකා පොලිසිය දියත් කර තිබෙන යුක්තිය මෙහෙයුම මඟින් මත්ද්‍රව්‍ය ජාවාරම සහ පාතාල ක්‍රියාකාරකම් අතිශය සීමා කිරීමටද සමත් විය. සූදු ක්‍රීඩා මඟින් අපේක්ෂිත බදු ආදායම් නිසි පරිදි අයකරගැනීම, සූදු ක්‍රියාකාරකම් හා සම්බන්ධ අපරාධ ක්‍රියාවන් වැළැක්වීම, සූදු ක්‍රීඩාවන් මඟින් පුද්ගලයින්ට හා සමාජයට සිදු වන අයහපත් ප්‍රතිවිපාක අවම කිරීම වැනි කාර්යයන් සඳහා සූදු ක්‍රීඩා නියාමනය කිරීමේ අධිකාරිය නමින් නියාමන ආයතනයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.





## සජිත් විහිළුවලට මිනිස්සුන්ගෙ දුක නිවන්න බෑ

සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මහතා ද මෙවර ජනාධිපතිවරණ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන බවත් එළැඹෙන මහ මැතිවරණයේ දී තමන්ගේ ආණ්ඩුවක් ගොඩ නඟන බවත් පවසමින් තිබේ.

සජිත් ප්‍රේමදාස මහතා ජනාධිපතිවරණයට ඉදිරිපත් වන්නේ දෙවන වතාවටය. 2019 දී ජනාධිපතිවරණයට එක්සත් ජාතික පක්ෂය මූලික සන්ධානකින් ඔහු ඉදිරිපත් විය. නමුත් එහි දී ඔහු පරාජයට පත් විය. එදා ඔහු ලැබුවේ ඡන්ද ලක්ෂ 55 කි. එහි ප්‍රතිශතය සියයට 42 කි. එම පාරාජයෙන් අනතුරුව මාස කිහිපයකින් පැවැත් වූ මහ මැතිවරණයට ඉදිරිපත් වූයේ එක්සත් ජාතික පක්ෂය දෙකඩ කරමින් ගොඩනැගු සමගි ජන බලවේගයෙනි. එහි නායකයාව සිටිමින් ජනධිපතිවරණයේදී සහය වූ එජාපයේ නායකයා සහ එම පාක්ෂිකයන් හැර තමන්ට සහය දුන් සෙසු කණ්ඩායමද සමඟ ඉදිරිපත් වී ලබාගත්තේ ඡන්ද 27 ලක්ෂයකි. සියයට 23 කි. මෙවර ඔහු ඉදිරිපත් වන්නේ එදා සහය දුන් ප්‍රබල චරිත ගනනාවකගේ සහය නොමැතිව පොදු ජන පෙරමුණෙන් (පොහොට්ටුවෙන්) ඉවත් වූ ජාතිකවාදී කණ්ඩායමක් සමඟය.

කොහොම නමුත් සජිත් ප්‍රේමදාස මහතා මෙවර ජනධිපතිවරණයට ඉදිරිපත් වන්නේ ජයග්‍රහණය ලබාගැනීමේ අරමුණ සහිතවය. නමුත් රටේ දේශපාලනය ගැන අවබෝධයක් සහිත අයෙකුට ප්‍රේමදාස මහතාට ජය ගැනීමේ පුළුවන් කමක් නැති බව පැහැදිලි කළ යුතු නැත. අවසන් වරට ලක්ෂ 27 කට සීමා වූ ඡන්ද පදනම එතැනින් එහා වර්ධනය වන්නට තරම් අශ්චර්යයක් සිදුව නොමැත. යමක් සිදු වූවානම් ඒ ඔහුගේ දේශපාලනික නොමේරුකම, බොළඳකම, නොදන්නාකම තවදුරටත් ඉස්මතු වී පෙනීම පමණි.

ඒ කුමක් වුවත් වැදගත් දෙය නම් ඔහු බලයට පත්වූ පසුව මේ රට ගොඩනැංවීම වෙනුවෙන් සිදු කරන්නේ කුමක්ද යන්න දැනගැනීමය. මැතිවරණ වේදිකා මත සිදු කරන ජනප්‍රිය පොරොන්දු ආණ්ඩු බලයක් ලබා ක්‍රියාත්මක කළ හැකිදැයි කල්පනා කළ යුතුය. තමන්ට මුණ ගැහෙන ජන කොටස් ඉදිරියේදී ඔවුන්ගේ අවශ්‍යතා සියල්ල රජය මඟින් නොමිලයේ ලබා දීමට තමන්ගේ ආණ්ඩුවක් යටතේ සිදුකරන බවට දෙන පොරොන්දු මත ඔහුගේ දේශපාලනය පදනම්ව තිබේ. මේ පොරොන්දු වලට ජන කොටස් ආකර්ෂණය විය හැකි නමුත් මේවා සිදු කළ හැකිදැයි විමසිය යුතුය.

රට ආර්ථික අර්බුදයක මැදි වීමට හේතු වූයේ රාජ්‍ය වියදම ඉහළ යෑම සහ ආදායම් අඩු වීමත් ඒ මත ගොඩනැගුනු ණය කන්දරාව ගෙවාගැනීමේ නොහැකියාවත් මත බංකොලොත් බව ප්‍රකාශයට පත් විය.

එහෙත් සජිත් ප්‍රේමදාස මහතාගේ ජනප්‍රිය පොරොන්දු දේශපාලනය තුළ ඇත්තේ රාජ්‍ය ආදායමෙන් සිදු කරන සහනාධාර බෙදීම්ය. රාජ්‍ය ආදායම් වර්ධනය කරගැනීම ගැන කතාවක් නැත. එමෙන්ම තමන් බලයට ලැබුණු පසු බදු ලිහිල් කිරීම, විදුලි ගාස්තු අඩු කිරීම, ඉන්ධන මිළ අඩු කිරීම ආදි පොරොන්දු තිබේ. රාජ්‍ය සේවයට තවත් පිරිස් බඳවා ගැනීමේ පොරොන්දු ද රාජ්‍ය සේවා වැටුප් වැඩි කිරීමේ පොරොන්දු ද වෙයි. මේ අනුව ඉතාම පැහැදිලි ඇත්ත නම් රජය ඉතා වේගයෙන් මාස කිහිපයක් තුළ යළි බංකොලොත් භාවයට පත් වීම සිදුවීම නියතයක් බවය.

ඒ අතරම ජාතන්තර මුල්‍ය අරමුදලේ සහය ඇතිව ක්‍රියාත්මක කරන ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වෙනස් කරන බව පවසයි. වෙනස් කිරීම කුමක් වුවත් මෙම උත්සාහයම මුල්‍ය අරමුදලේ සහය ලබා දීම අත්හිටුවීමට හේතු වනු ඇත. යළිත් එහි සහය ලබාගැනීම සිදු විය හැක්කේ බංකොලොත් රාජ්‍යයක් ලෙසය. අලුත් බරපතල කොන්දේසි වලට ද යටත්වය.

නමුත් ප්‍රේමදාස මහතාගේ ප්‍රතිපත්ති අනූව කිසිවිටෙක මුල්‍ය අරමුදලට ඔහු හා එකඟ වීමක් විය නොහැකිය.

සමගි ජන බලවේගයේ ආර්ථික කමිටුව යැයි කියන තුන් කට්ටුව නිරන්තරයෙන් මුල්‍ය අරමුදලට සමගාමී මතයක හිඳිමින් එනම් ජනධිපති රනිල් ක්‍රියාත්මක කරන ආර්ථික ප්‍රතිසංස්කරන වලට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟව මත පල කරයි. ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය ලෙස ප්‍රකාශිත බ්ලූ ප්‍රින්ට් නම් ලියවිල්ල ප්‍රේමදාස මහතා හෝ පොහොට්ටුවෙන් එකතුතරගත් ජාතිකවාදී කණ්ඩායම පිළිගන්නේ නැත. මේ නිස සජබය ක්‍රියාත්මක කරන ඇත්ත ආර්ථික ප්‍රතිපත්තිය කුමක්ද යන ගැන පැහැදිලි නැත.

මේ නිසා සිදුවිය හැකි මතගැටුම වල ප්‍රතිලයද මේ රටට හානි දායක වනු ඇත. එමෙන්ම එම පක්ෂයද යළි කැඩී විසිරීමත් සිදු විය හැකිය. සජබය ගොඩනැංවීමට දර දිය ඇදි විශාල පිරිසක් එයින් ඉවත්ව ඇත්තෙත් ප්‍රේමදාස මහතා සහ ඔහුගේ කණ්ඩායම සමඟ මේ ගැටලු නිරාකරණය කරගත නෙහැකි නිසාය.

එසේම සජබයට එකතුකර ගත් පොහොට්ටුවේ ජාතිකවාදි පිරිස පක්ෂයේ ආධිපත්‍ය දරණ නිසා ඔවුන් දරණ ජාතිවාදී ආගම්වාදී මත පදනම්ව දෙමල මුස්ලිම් ප්‍රජාවගේ අපේක්ෂාවන් ඉටු කිරීමට ප්‍රේමදාස මහතා සමත් නොවනුද ඇත.

මේ අනුව සජබ පාලනය, ආර්ථිකමය වශයෙන් බංකොලොත් සහ දේශපාලනික වශයෙන් වර්ගවාදි වන විගඩමක් වීම වැලැක්විය නොහැකි වනු ඇත. එමෙන්ම මේ බංකොලොත් වීම 2022 දී ඇද වැටුණු තැනින් නතර නොවේ. ඊටත් එහා දුර්භාග්‍යමත් බෙදනීය තැනකට ඇද වැටෙනු ඇත. ඒ හැර වෙනත් කිසිවක් සජබ පාලනයක් යටතේ සිදු වීමට නියමිත නැත.

## අනුරගෙ බොරුවලින් රට ගොඩගන්න බෑ

අනුර කුමාර මහතා ජනතා විමුක්ති පෙරමුණේ නායකයාය. එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණ විසින් මෙහෙයවනු ලබන ජාතික ජන බලවේගය නම් පක්ෂයේ ද නායකයා වෙයි. මෙම පක්ෂ දෙකේ වෙනස ජාතික ජන බලවේගය, ජවිපෙන් පිටස්තර වියතුන්ය කියන පිරිසකට තනතුරු ලබා දී පවත්වාගෙන යෑමත් ජවිපෙන් වෙනස් බව පෙන්වීමේ සංදර්ශනාත්මක දේශපාලනය නිසාත් පමණය.

කොහොම නමුත් අනුර කුමාර මහතාත් මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත් වන්නේ දෙවැනි වතාවටය. 2019 වසරේදී ජාතික ජන බලවේගයේ අපේක්ෂකයා ලෙස ජනාධිපතිවරණයට ඉදිරිපත් වී ඔහු දරුණුම පරාජයකට ලක් විය. එවර විශාල ජනප්‍රියතාවයක් සහිත ජන රැල්ලක් මතින් රටේ ජනාධිපතිවරයා ලෙස තමන් පත් වෙනු ඇති විශ්වාසයෙන් ඔහු මැතිවරණයට ඉදිරිපත් වූවත් ලබාගත් ඡන්ද සංඛ්‍යාව ලක්ෂ 4 කට සීමා විය. සියයට 3 කි. ඉන් පසුව මහ මැතිවරණයට ඉදිරිපත් වී ලක්ෂ 4 ක් ලබා ගත්තේය. අද ලක්ෂ 4 ක පමණ ඡන්ද පදනමක් මත, ලක්ෂ 75 ක පමණ ජනවරමක් අපේක්ෂාවෙන් ඔහු සිටී.

කොහොම නමුත් අනුර කුමාර මහතා ජනප්‍රිය දේශපාලනය වෙත යළිත් අවතීරණය වෙමින් මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම සඳහා වසර ගනනාවක සිට සූදානම් විය. ඔහුගේ ජනප්‍රිය රැල්ල අති විශාල විය. එමෙන්ම 2022 වසරේ වූ පුරවැසි අරගලයේ දේශපාලනික වාසියද ඔහු අත්පත් කරගත් අතර ඔහු අනෙක් සියලු පක්ෂ වලට අභියෝගාත්මක වන ලෙස ප්‍රචාරක කටයුත්තේ නියැලී සිටී. මේ නිසා ඔහු මෙවරද තමන් ජනාධිපති වෙනු ඇතැයි පූර්ව විශ්වාසයකින් පසුවේ.

කොහොම නමුත් අනුර කුමාර ජනාධිපති වී ඔවුන්ගේ ආණ්ඩුවකුත් පිහිටුවා ගැනීම සිදු කළහොත් මේ රට ගොඩනැගුම වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද ගැන දැනටම ඇත්තේ බරපතල ව්‍යාකූලත්වයකි. විශේෂයෙන්ම ජවිපයේ සමාජවාදී මතවාදයත් ජාතික ජන බලවේගයට ඒක රාශිව සිටින විවිධාකර අදහස් දරණ වියතුන්ගේ මතයනුත් අතර විශාල පරස්පරයන් මේ වන විට පෙන්වා අවසන්ය. ජවිපෙ නායකයන් සමාජවාදී දේශපාලනයට උරුම ඒකපාක්ෂික භාවයන් ප්‍රචණ්ඩාකාර අදහස් සමඟ ඔවුන්ගේ පාලන බලයක් බලහත්කාරයෙන් වුව පවත්වගෙන යන ආකර ගැන නිරන්තරයෙන් පවසයි. එමෙන්ම ජාජබයේ වියතුන් පවසන දේට විරුද්ධ මතයක් සිටිමින් ඒවා හෙළා දකින තැනටද පත්ව තිබේ. ඒ අතර ජාජබයේ වියත්තුන්ද ජවිපෙ මතවාදය හෙළා දකිමින් තිබේ. ඒ අතරම ජවිපෙත් ජාජබයෙත් නායකයන් ප්‍රකාශයට පත් කරනු ලබන මුග්ධ අදහස් සාධාරණීයකරණය කිරීමට, ඒ කීවේ ඒක නෙවෙයි මේකය, කියමින් වෙනත් අර්ථ දැක්වීම සිදුකිරීම, අනුර කුමාර මහතාට ඔහුගේ ප්‍රධාන රාජකාරියක් කරගන්න සිදුවන තරම් තත්වයන් බරපතල විය.

කොහොම නමුත් මේ පක්ෂ දෙක සතුවම රට ගොඩනැගුම ගැන නිශ්චිත ආර්ථික ප්‍රතිපත්තියක් නැත. මෑතක් වන තෙක්ම ඔවුන් 2019 වසරේ ඉදිරිපත් කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය තමන්ගේ ප්‍රතිපත්තිය බව කියමින් සිටියද ඒ තුළ වූ බරපතල වැරදි අඩුපාඩුකම් විහිළු සහගත කරුණු ආදි ගැන එල්ල වූ විවේදනයන් හමුවේ එය ප්‍රතික්ෂේප කිරීමද සිදු කළේය. තවත් විටෙක තමන්ගේ ආර්ථික් ප්‍රතිපත්තිය යනු තමන්ගේ ඒ ඒ නායකයන් ඒ ඒ මොහොතේ පවසන ලබන දේ බවත් ජවිපෙ නායකයකු කරුණු පැහැදිලි කිරීමක් සිදු කර තිබිණි. මේ විකාර සහගත තත්වයන් මත රටක පාලනය අනුර කුමාර මහතාට බාරදුන්හොත් විය හැකි අලකලංචිය ගැන අමුතුවෙන් කිව යුතු නැත.

එමෙන්ම ජවිපෙ නායකයන් විටින් විට පවසනු ලබන දේ අනුව මේ අයද සහනාධාර බෙදාහැරීම මුලිකව කළ ආර්ථික ක්‍රමයක් යෝජනා කරයි. රාජ්‍ය ආදායම මේ වෙනුවෙන් වැය කිරීමට දෙවරක් නොසිතනු ඇත. රාජ්‍ය සේවක වැටුප 25,000 ක් ඉල්ලා මෙහෙයවූ වැඩවර්ජන රැල්ල අනුව එම වැටුප් වැඩි කිරීම සිදුකිරීමට සිදු වනු ඇත. එමෙන්ම රාජ්‍ය සේවයට කරන බඳවාගැනීම වැඩි කරනු ඇත. රාජ්‍ය කේන්ද්‍රිය ආර්ථිකයක් ගොඩනඟන බවට පොරොන්දු වී ඇති අතර තවත් රාජ්‍ය ආයතන අති විශාල ප්‍රමාණයක් ගොඩනැගීමත් සිදු කරනු ඇත. පාඩු පිට පාඩු ලැබුවත් රාජ්‍ය ආයතන ජාතික සම්පත් සේ සුරැකීම මේ අයගේ ප්‍රතිපත්තිය වී තිබේ. පෞද්ගලික අංශයට වැඩි ඉඩ පහසුකම් නොලැබෙනු ඇත. පෞද්ගලිකකරණය හෝ ප්‍රතිව්‍යුහගත කිරීමට ලක් කරන රාජ්‍ය ආයතනත් යළි රජය යටතට ගැනීමත් විය හැකිය. රාජ්‍ය ආදායම් මේවා නඩත්තුවට යොදවනු ඇත. එසේම විශාල බදු ලිහිල් කිරීම් වලට යනු ඇත. එය දැඩිව ලබා දී ඇති පොරොන්දුවකි.

රාජ්‍ය ආදායම් උපයා ගැනීම ගැන වගක් නැති නමුත් රාජ්‍ය වියදම් කිහිප ගුණයකින් වැඩි වෙන ප්‍රතිපත්ති මත සිදු වියහැකි එකම දේ රට යළි බංකොලොත් වීම බව පැහැදිලිය. එසේම ජවිපෙ නායකයන් විටින් විට කරන ප්‍රකාශ අනුව රටක ආර්ථිකයක් මෙහෙය වීම ගැන තබා සිල්ලර කඩයක්වත් පාඩු නොවී කරගැනීමේ පරිචයක් මොවුන්ට නැති බවත් සැක නැත. එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි රටින් පිටත කිසිදු ආයතනයක් මේ අයගේ පිළිගැනීමට ලක් වන්නේ නැත. ඒ තබා එම ආයතන සමඟ ගනුදෙනු කරන්නේ කොහොමදැයි අවබෝධයක්වත් නැති බව ජවිපෙ ආර්ථික විශේෂඥයන් කියන අය රටේ ආර්ථික ගැටලු ණය අර්බුදය විසඳීම ගැන කරන නන්දෙඩවීම් වලින් පැහැදිලිය.

එමෙන්ම ජවිපෙ සහ ජාජබ වියතුන් අතර වන මත ගැටුම්, නායකත්ව ගැටුම් ආදිය නිසාත් මේ අයගේ ආණ්ඩුවකට මාස කිහිපයක් තුළ රට බංකොළොත් කිරීමේ හැකියාව හොඳටම තිබේ.

# යටහත් නැති විදේශ ප්‍රතිපත්තියක්

ගෝලීය භූ දේශපාලන ගැටුමට මැදි නොවී නොබැඳි පිලිවෙතක සිට සහ කලාපීය වශයෙන් බලපෑම් සහගත රාජ්‍යයක් වශයෙන් රට ගොඩනැගුමට අවශ්‍ය ජාත්‍යන්තර නිර්ණායකයන් සපුරා ගැනීමේ අරමුණු ඇතිව රටේ විදේශ ප්‍රතිපත්තිය නවීකරණය කිරීමට පියවර ගත්තේය. මේ අනුව විශේෂයෙන්ම දකුනු සහ අග්නිදිග ආසියානු කළාපීය ආර්ථික වර්ධනය සමඟ කලාපයට අත්පත් කර ගත හැකි ගෝලිය දේශපාලනික හා ආර්ථික බලයේ හවුල්කාරිත්වය අත්පත්කර ගැනීම හරහා රටට ප්‍රතිලාබ උපදවන මාර්ගයකට අවතීරණය වීමට අව්‍යශ විදේශ ප්‍රතිපත්තියක් 2030 වසර දක්වා කාලය තෙක් නිර්මාණය වෙනු ඇත.

# පුරවැසි ආරක්ෂාව සහතික කිරීම

ත්‍රස්තවාදයේ සහ ප්‍රචණ්ඩ අන්තවාදයේ නව මානයන් සම්බන්ධයෙන් විධිවිධාන හඳුන්වා දීමට දැනට පවතින ත්‍රස්ත විරෝධී නීතිවල දුර්වලතා මගහරවා ගැනීමටත්, එවැනි ක්‍රියාවලට මුහුණ දීමටත්, නීතිය බලාත්මක කිරීමටත්, විමර්ශන හා අධීක්ෂණ මෙවලම් තවදුරටත් ශක්තිමත් කිරීමටත් පුළුල් ජාතික ආරක්ෂක නීති පද්ධතියක් හඳුන්වාදීමේ අවශ්‍යතාව සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධ අන්තර්ජාතික ප්‍රමිතීන්, නිර්දේශ සැලකිල්ලට ගනිමින් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පරිපූර්ණ නීති පද්ධතියක් සඳහා අවශ්‍ය කටයුතු සිදු කළේය. නව ත්‍රස්ත විරෝධී පනතක් හඳුන්වා දීම සිදුකර ඇත. මහජන ආරක්ෂාව සහ සාමය ස්ථාපිත කිරීම වෙනුවෙන් වන බාධා දුර්වලකම් මග හැරීමට හා කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ශ්‍රී ලංකා පොලිස් සේවය ගොඩනැගීමේ පියවරයන්ද ගෙන තිබේ. ජාතික ආරක්ෂාවට අදාළ කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට උපදෙස් දීම මෙන්ම ඒ හා සම්බන්ධ දේශීය, විදේශීය, ආර්ථික සහ හමුදා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීමේ මූලික විධායක ආයතනය වශයෙන් කටයුතු කිරීම වෙනුවෙන් නව 'ජාතික ආරක්ෂක මණ්ඩලය' ස්ථාපිත කිරීමටද අවශ්‍ය පියවර ගෙන ඇත.







# අපට ආපසු හැරෙන්න බෑ

ජනාධිපති රනිල් වික්‍රමසිංහ දෙවසරක් මුළුල්ලේ සිදුකරමින් සිටින දැවැන්ත කාර්යභාරය කුමක්ද යන්න සංක්ෂිප්ත සටහනකින් සඳහන් කිරීම පහසු නැත. තවත් ලෙසකින් කිවහොත් නිදහසෙන් පසුව මෙරට රාජ්‍ය නායකයකු රට වෙනුවෙන් සිය ධුරකාලය තුළ ගත්තා වූ ක්‍රියාමාර්ග හා සැසඳීමේදී මෙම දෙවසර තුළ ජනාධිපති ඒ සියළු දෙනාටම වඩා ඉදිරියෙන්ම සිටිනවා යැයි කීම අතිශයෝක්තියක් නොවේ. ඒ තවදුරටත් ඉස්මතු වන්නේ බංකොළොත් බවට පත්වුණු රටක් යළි කෙලින් කටින් සිටුවා මෙම පෙළහර පෑමට සමත් වීමත් සිදු වීම මතය. කොහොම නමුත් මේ ජනාධිපති රනිල් පටන් ගත්තා පමණය. ඒ අනුව ඉදිරි වසර කිහිපය ගෙවෙනු ඇත්තේ, අධිවේගී සංවර්ධන මාර්ගයකය. දියුණු වූ රාජ්‍යයක සිහිනය අත්විඳීමේ මොහොත පෙනෙන තෙක් මානයේ විය හැකිය. එහෙත් මේ ගමන, මේ වේගයෙන් සහ පරිස්සමෙන් යෑමට අවශ්‍ය අධිෂ්ඨානශීලි සහ නිවැරදි නායකත්වයක් තවදුරටත් රටට අවශ්‍යමය. ශ්‍රී ලංකා දේශපාලනය තුළ අප බොහෝ විට දුටුවේ රටට හිතකර හෝ අහිතකර වේවා ජනප්‍රිය තීන්දු මත රට පාලනය කරන නායකත්වයන්ය. එහෙත් වත්මන් ජනපති එම නායකයන් වෙතින් වෙනස් නායකයෙක් වන්නේ ඔහු රටට අවශ්‍ය නව සංකල්ප සහ ආකෘති හඳුන්වා දෙමින් වර්තමානයට වඩා අනාගතය ගැන සිතා අමාරු ජනප්‍රිය නොව
තීන්දු ගැනීමට බය නැති නායකයෙක් වන හෙයිනි. රටකට නව සංකල්ප සහ නව සංවර්ධන ආකෘතිය හඳුන්වා දීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ. පටු දේශපාලනික වාසි වෙනුවෙන් විපක්ෂ කණ්ඩායම්වලින් එල්ල වන දැඩි බාධාකිරීම් ද රටක අභිවෘද්ධිය පමා කරයි. නමුත් ජනපති රනිල් ඒ සියල්ලත් ජය ගෙන අද රට සංවර්ධනයේ ගමන් මඟට ගැනීමට සමත් වීම සුවිශේෂීය. රටක නායකයා ලෙස පෙනී සිටිය හැක්කේ තමන් තමන්ගේ නායකත්ව භූමිකාව හරියට ඉටුකරන බවට විශ්වාසයක් ඇති අයකුට පමණි. තමන්ට පැවරූ වගකීම තමන් නියමාකාරයෙන් ඉටුකළ බවට වගවිය හැකි නම් පමණි. තමන්ගෙන් බලාපොරොත්තු වූ නායකත්ව කාර්යභාරය ඒ ආකාරයෙන් විශ්වාසනීයව, වගකීම් සහගතව තවදුරටත් සිදුවෙනු ඇති බව ඍජුව පැහැදිලිව පෙන්වා දියහැකි නම් පමණි. ජනපති රනිල් කියන්නේ එහෙම නායකයෙකි. මේ වෙලාවේ වගේම ඉදිරියටත් රටට අවශ්‍යම වන්නේ මේ ජනාධිපතිම බව ඔහු විසින් ඔප්පු කර අවසන්ය. ඒ නිසා හෙට දවසෙත් 'රනිල් තමයි අපේ ජනාධිපති' කියන්න පුරවැසි ජනතාවට පුළුවන් වෙනු ඇත.



පිටකෝට්ටේ මිහෙන් පාරේ අංක 19/5/ඒ දරණ ස්ථානයේ පදිංචි නාමල් පතිරත්න වන මා විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී